# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - ජනවාරි 2023

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

## A - කොටස

වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න

**ප්‍රශ්න අංක 01 - ලකුණු 40**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත්ම සුදුසු පිළිතුරට අදාල අංකයද, ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා වූ ප්‍රන සඳහා දී ඇති එක් එක් ප්‍රකාශය **'සත්‍ය'** හෝ **'අසත්‍ය'** හා ප්‍රශ්න අංක **1.16** සිට **1.20** දක්වා වූ ප්‍රශ්න සඳහා නිවැරදි උත්තරය ප්‍රශ්න අංකය සමඟ උත්තර පොතේ ලියන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් ලබා දී තිබුණි.

අයදුම්කරුවන් එක් එක් අනු කොටස් සඳහා ලබා දී තිබූ උත්තර අනුව පොදුවේ දක්නට ලැබුණු වැරදි / දුර්වලතා කිහිපයක් පහත පරිදි වේ:

**ප්‍රශ්න අංක 1.1**

ගිණුම්කරණ නිමැවුමක් වන්නේ කුමක්ද යන්න විමසා තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන අංක 03 ඉදිරිපත් කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ලෙස ලෙජර් ගිණුම හා ශේෂ පිරික්සුම ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.2**

තොග ගණනය කිරීමේ ක්‍රමයට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය කාලපරිච්ඡේදය අතරතුරදී වෙනස් නොකිරීම සම්බන්ධයෙන් වන ගිණුම්කරණ සංකල්පය විමසා තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන සංගතතා සංකල්පය ඉදිරිපත් කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වෙනුවට අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය, පිළිතුර ලෙස ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.3**

දී ඇති තොරතුරු අනුව හීනවන ශේෂ ක්‍රමය යටතේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂය වීම් ගණනය කිරීමට උපදෙස් ලබාදී තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් තුළ ගණනය කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම මත නිවැරදි පිළිතුර අංක 02 වෙනුවට අංක 01 ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.4**

ඉදිරිපත් කර ඇති ගනුදෙනුව මඟින් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම විමසා තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් ගනුදෙනුවේ ද්විත්ව සටහන මඟින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම් පිළිබඳව අවබෝධයක් නොතිබීම මත නිවැරදි පිළිතුර අංක 02 වෙනුවට 03 ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 1.5

දී ඇති තොරතුරු උපයෝගී කර ගෙන 2022.03.31 දිනට මුදල් පාලන ගිණුමේ (මුදල් පොතේ) ශේෂය ගණනය කිරීම සඳහා උපදෙස් ලබාදී තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැතිවීම මත නිවැරදි පිළිතුර වන අංක 04 වෙනුවට අංක 01 හා 02 පිළිතුරු ලෙස ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 1.6

දී ඇති අයිතම අතුරින් ජංගම වත්කමක් ලෙස වර්ග කළ හැක්කේ කුමක්ද යන්න විමසා ඇත. බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන අංක 02 ඉදිරිපත් කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් නිවැරදි පිළිතුර වන "කලින් ගෙවීම්" වෙනුවට "විකුණුම්" නිවැරදි පිළිතුර ලෙස ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 1.7

ගිණුම්කරණ සංකල්ප පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂාකර තිබුණි. සියලුම අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුරවන අංක 02 ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 1.8

සැපයුම්කරුවන්ගෙන් ලැබුණු භාණ්ඩ වාර්තා කිරීමට ගබඩා භාරකරු විසින් භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල පිළිබඳව විමසා තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන අංක 02 ඉදිරිපත් කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර වන අංක 02 වෙනුවට අංක 03 ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 1.9

ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කර ගනිමින් 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමට අයදුම්කරුවන් වෙත උපදෙස් ලබාදී තිබුණි. ලාභය ගණනය කිරීම පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් සමහර අයදුම්කරුවන්ට නොතිබීම මත නිවැරදි පිළිතුර වන අංක 01 වෙනුවට අංක 02 හා 03 පිළිතුරු ලෙස ඉදිරිපත් කර තිබුණි. කෙසේවෙතත් බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

### ප්‍රශ්න අංක 1.10

ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා ලබාගත් බැංකු ණය මුදලේ ප්‍රාග්ධනය වශයෙන් ආපසු ගෙවන ලද රු.1,750,000 ක මුදල ලෙජර් ගිණුම් වල වාර්තා කිරීම පිළිබඳව විමසා තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් තුල ද්විත්ව සටහන පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැතිවීම මත නිවැරදි පිළිතුර වන අංක 02 වෙනුවට 03 හා 04 පිළිතුරු ලෙස ඉදිරිපත් කර තිබුණි.

ප්‍රශ්න අංක **1.11** සිට **1.15** දක්වා අයදුම්කරුවන් වෙත ලබාදී ඇති ප්‍රකාශයට අනුව 'සත්‍ය' හෝ 'අසත්‍ය' ලෙස පිළිතුරු ලබාදිය යුතුව තිබුණි. හඳුනාගත් පරිදි පොදු වැරදි පහත පරිදි වේ:

### ප්‍රශ්න අංක 1.11

සමහර අයදුම්කරවන් විසින් දී ඇති ප්‍රකාශය සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ සංකල්පය පිළිබඳව නිවැරදි අවබෝධයක් නොමැතිවීම නිසා නිවැරදි පිළිතුර 'අසත්‍ය' වෙනුවට 'සත්‍ය' ලෙස ඉදිරිපත් කර තිබුණි. කෙසේවෙතත් බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.12**

පොදු ජ'නලයේ සටහන් කරන ගණුදෙනු පිළිබඳ ප්‍රකාශයක් දී තිබුණි. සමහර අයදුම්කරුවන් විසින් දී ඇති ප්‍රකාශය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැති වීම මත නිවැරදි පිළිතුර වන 'අසත්‍ය' වෙනුවට 'සත්‍ය' ලෙස ඉදිරිපත් කර තිබුණි. කෙසේවෙතත්, බොහෝමයක් අයදුම්කරුවන් විසින් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.13**

ගැනුම් ගිණුම නාමමාත්‍ර ගිණුම් සඳහා උදාහරණයකි. සමහර අයදුම්කරුවන් විසින් මේ ප්‍රකාශය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් නොමැතිවීම මත නිවැරදි පිළිතුර වන 'සත්‍ය' වෙනුවට 'අසත්‍ය' ලෙස ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.14**

සුළු මුදල් අග්‍රිමය පිළිබඳ ප්‍රකාශයක් දී තිබුණි. අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් දී ඇති ප්‍රකාශය නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුර 'සත්‍ය' ලෙස ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.15**

වගකීම් ගිණුමක ශේෂය සාමාන්‍යයෙන් බැර ශේෂයකි. අයදුම්කරුවන් වැඩි ප්‍රමාණයක් දී ඇති ප්‍රකාශය නිවැරදිව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුර 'අසත්‍ය' ලෙස ඉදිරිපත්කර තිබුණි.

ප්‍රශ්න අංක **1.16, 1.17, 1.18, 1.19** හා **1.20** සඳහා වූ පිළිතුර උත්තර පොතේ ලිවීමට උපදෙස් ලබාදී තිබුණි.

**ප්‍රශ්න අංක 1.16**

ස්කන්ධය (හිමිකම) යන පදයෙහි නිර්වචනය පිළිබඳව විමසා තිබුණි. මේ සඳහා සියලුම අයදුම්කරුවන් විසින් සම්පූර්ණ නිර්වචනය ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. ඉදිරිපත් කර තිබූ පිළිතුරු අසම්පූර්ණ පිළිතුරු විය. කෙසේනමුත් සමහර අයදුම්කරුවන් විසින් නිවැරදි නිර්වචනය ඉදිරිපත් කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.17**

මූල්‍ය ගිණුම්කරණය සහ කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම් දෙකක් හඳුනා දක්වන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් ලබාදී තිබුණි. අයදුම්කරුවන් වැඩි සංඛ්‍යාවක් වෙනස්කම් පැහැදිලිව හඳුනාගෙන නිවැරදි පිළිතුර ඉදිරිපත්කර තිබුණි.

**ප්‍රශ්න අංක 1.18**

ව්‍යාපාර අචාරධර්ම සම්බන්ධව ඔබගේ අදහස කෙටියෙන් පැහැදිලි කරන මෙන් විමසා ඇත. බොහෝමයක් අයදුම්කරුවන් විසින් පැහැදිලි නිවැරදි අදහසක් ඉදිරිපත් කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් මේ සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**ප්‍රශ්න අංක 1.19**

විශේෂිත ගිණුම්කරණ මෘදුකාංග සඳහා උදාහරණ දෙකක් විමසා තිබුණි. අයදුම්කරුවන්ගෙන් වැඩි සංඛ්‍යාවක් තුළ විශේෂිත ගිණුම්කරණ මෘදුකාංග පිළිබඳව අවබෝධයක් නොමැති වීම මත පොදු අවශ්‍යතා සඳහා යොදාගන්නා මෘදුකාංග, පිළිතුර වශයෙන් ඉදිරිපත් කර තිබුණි.

උදාහරණ :- Accpack, Quick Book, MYOB

**ප්‍රශ්න අංක 1.20**

මූලික සටහන් පොත් පවත්වාගෙන යාමේ වැදගත්කම් දෙකක් විමසා තිබණි. අයදුම්කරුවන්ගෙන් වැඩි සංඛ්‍යාවක් විසින් නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි.

## B - කොටස

**ප්‍රශ්න අංක 02 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

ලෙජර් ගිණුම් පිළියෙළ කිරීමෙන් පසු ශේෂ පිරික්සුම පිළියෙල කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගේ කාර්යසාධනය හොඳ මට්ටමක තිබුණි.

(1) ශේෂ පිරික්සුම සකස් කිරීම වෙනුවට සමහර අයදුම්කරුවන් ලෙජර් ගිණුම් පමණක් පිළියෙල කර තිබුණි.

(2) ශේෂ පිරික්සුමේ හර විය යුතු සංඛ්‍යා බැරටද බැර විය යුතු සංඛ්‍යා හරටද සටහන්කර තිබුණි.

(3) ණයට විකුණුම් හා ණයට ගැනුම් ණයගැති හා ණයහිමි පාලන ගිණුම් තුලින් නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) අත්පිට විකුණුම්, ණයට විකුණුම්, අත්පිට ගැනුම් සහ ණයට ගැනුම් ශේෂ පිරික්සුමේ වෙන වෙනම අයිතමයන් ලෙස සටහන් කිරීම.

(5) 2022 ජනවාරි 01 දින මිලදී ගෙන ඇති යන්ත්‍රය සඳහා 25% බැගින් මාස 3 ක් සඳහා ක්ෂය නිවැරදිව ගණනය කර නොතිබුණි.

(6) යන්ත්‍ර සඳහා ගණනය කරන ලද ක්ෂය ප්‍රමාණය ශේෂ පිරිකසුමේ යන්ත්‍රයේ අගයෙන් අඩුකර ශුද්ධ අගය සටහන් කර තිබුණි.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නය මඟින් සිදුකර තිබුණි.

බොහෝමයක් අයදුම්කරුවන් සතුටුදායක මට්ටමෙන් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ඉදිරිපත්කර තිබුණු අතර පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) නිවැරදි ආකෘතියේ ඉදිරිපත් කර නොතිබුණි.

(2) නොනිමි වැඩ, නිෂ්පාදන පිරිවැයට ගැලපීම් නොකර ප්‍රාථමික පිරිවැයට ගැලපීම් කර තිබුණි.

(3) සෘජු වේතන, සෘජු වියදම් යටතේ ගැලපීම් කළ යුතු වුවද සමහර අයදුම්කරුවන් පොදුකාර්යය වියදම් ලෙස සටහන්කර තිබුණි.

(4) පොදුකාර්යය වියදම්, කම්හල හා කාර්යාලය සඳහා දී ඇති ප්‍රතිශත අනුව නිවැරදිව ගණනය කර නොතිබුණි.

(5) අමුද්‍රව්‍ය වර්ෂය මුල තොගය හා අමුද්‍රව්‍ය අවසාන තොගය මාරුකර ඉදිරිපත් කර තිබුණි.

(6) නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභ ආන්තිකය ගණනය කර නොතිබුණි.

(7) ගණනය කරන ලද පරිභෝජනය කළ අමුද්‍රව්‍ය, ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය සඳහා නාමයන් ලියා නොතිබුණි.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(A)** හා **(B)** වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ.

**A කොටසින්** දී ඇති ගිණුම්කරණ සමීකරණයේ අංක 1 සිට 5 දක්වා ඇති එක් එක් අයිතමයන් සඳහා සිදුවිය හැකි ගනුදෙනුව හඳුනාගෙන ඉදිරිපත් කිරීම සහ **B කොටසින්** ගලපන ලද මුදල් පාලන ගිණුම සකස් කර 2022 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. අයුම්කරුවන්ගේ කාර්යසාධනය හොඳ මට්ටමක තිබුණි.

**(A)** අංක 1 සිට 5 දක්වා දී ඇති ගිණුම්කරණ සමීකරණයන්ට අදාලව සිදුවිය හැකි ගනුදෙනු බොහෝමයක් අයදුම්කරුවන් විසින් හඳුනාගෙන නිවැරදි පිළිතුර ඉදිරිපත් කර තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් විසින් සමීකරණයේ අංක 01 ගණුදෙනුව සඳහන් කිරීමේදී මුදලින් ආයෝජනය කිරීම ලෙස ඉදිරිපත් කර නොතිබුණි. අංක 03 හා 04 ගනුදෙනු වලදී ද අදාළ ණයට ගැනුම් හා ණයට විකුණුම් සම්බන්ධ ගනුදෙනු සඳහන් කිරීමේදී 'ණය පදනම' යනුවෙන් සඳහන්කර නොතිබුණි.

**(B)** **(a)** ගලපන ලද මුදල් පාලන ගිණුම පිළියෙල කිරීමේදී අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ පිළිතුරු අනුව පහත දුර්වලතා නිරීක්ෂණය විය:

(1) මුදල් පොතේ පමණක් සටහන් කල යුතු ගනුදෙනු හඳුනානොගෙන සියලුම ගනුදෙනු මුදල් පොතේ ගලපා තිබුණි.

(2) හර කල යුතු ගනුදෙනු බැරට ද බැර කල යුතු ගනුදෙනු හරට ද ගිණුමේ සටහන් කර තිබුණි.

(3) මුදල් පාලන ගිණුමේ ආරම්භක ශේෂය ගිණුමේ හරට සඳහන් කළයුතු වුවද සමහර අයදුම්කරුවන් බැරට සටහන් කර තිබුණි.

(4) මුදල් පොතේ ආරම්භක ශේෂය මුදල් පොතට ගෙන නොතිබුණි.

(5) මුදල් පොත නියමිත පරිදි තුලනය කර අවසාන ශේෂය ගණනය කර නොතිබුණි.

**(b)** බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී අයදුම්කරුවන් විසින් ඉදිරිපත්කර තිබූ පිළිතුරු අනුව පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(1) බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ සටහන් කළ යුතු ගනුදෙනු හඳුනා නොගෙන සියලුම අයිතමයන් බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ ගලපා තිබුනි.

(2) සමහර අයදුම්කරුවන් සංශෝධිත මුදල් පොතේ ශේෂයන් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ආරම්භක බැංකු ප්‍රකාශනයේ ශේෂය ලබාගෙන තිබූ අතර තවත් සමහර අයදුම්කරුවන් බැංකු ප්‍රකාශනයේ ශේෂයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශනය ආරම්භකර සංශෝධිත මුදල් පොතේ ශේෂය ලබාගෙන තිබුණි. මෙහිදී සමහර අයදුම්කරුවන් විසින් මෙම අවස්ථා දෙකේදී එකතුකල යුතු අයිතමයන් අඩුකිරීමටද අඩුකලයුතු අයිතමයන් එකතු කිරීමට ද කටයුතු කර තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 10**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය **(A)** හා **(B)** ලෙස කොටස් දෙකකින් සමන්විත විය. **(A) කොටසින්** වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් පිළියෙල කර ඒ අනුව අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීමටත් **(B) කොටසින්** ඉදිරිපත් කර ඇති තොරතුරු උපයෝගී කර ගෙන 2022 අප්‍රේල් මාසය සඳහා වෙළඳ ලැබිය යුතු මුදල් පාලන ගිණුම පිළියෙල කිරීමටත් උපදෙස් ලබා දී තිබුණි. බොහෝමයක් අයදුම්කරුවන් සතුටුදායක ලෙස පිළිතුරු ඉදිරිපත් කර තිබූ අතර පහත සඳහන් දුර්වලතා හා වැරදි පොදුවේ දක්නට ලැබුණි.

**(A)** **(a)** (1) ජර්නල් සටහන් වෙනුවට ලෙජර් ගිණුම් පිළියෙල කර තිබීම.

(2) ජර්නල් සටහනට අදාල හර හා බැර අගයන් ජර්නල් සටහන ලිවීමේදී මාරු කර ඉදිරිපත් කර තිබුණි.

(3) ජර්නල් සටහන් පිළියෙල කිරීමේදී ජර්නලයේ ගනුදෙනුව ඉදිරියෙන් හර හා බැර යනුවෙන් සටහන් කර නොතිබුණි.

(4) අවිනිශ්චිත ගිණුම මඟින් නිවැරදි කළ යුතු සටහන් නිවැරදිව හඳුනාගෙන නොතිබීම.

(5) සටහන් අංක 3 මඟින් රු.65,000/- ක කුලී වියදම්, කුලී ආදායම් ගිණුමට බැර කිරීම නිවැරදි කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයක් නොමැතිවීම මත කුලී වියදම් හෝ කුලී ආදායම් ගිණුමේ පමණක් සටහන් කර තිබුණි.

(6) සටහන් අංක 4 මඟින් රු.65,000/- ක දුරකථන වියදම මුදල් පොතේ නිවැරදිව සටහන් වුවද දුරකථන වියදම් ගිණුමේ රු.56,000/- ක් ලෙස සටහන් වීම නිවැරදි කිරීමේ වෙනසට බලපාන රු.9,000/- ක වෙනස නිවැරදිව හඳුනාගෙන ජර්නල් ඉදිරිපත්කර නොතිබුණි.

**(b)** අවිනිශ්චිත ගිණුම පිළියෙල කිරීම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය:

(1) අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය ගිණුමේ හර ලෙස සටහන් කිරීම හා ආරම්භක බැර ශේෂය ගිණුමේ සටහන් කර නොතිබුණි.

(2) අවිනිශ්චිත ගිණුමට අදාල හර සටහන් එම ගිණුමේ බැර පැත්තේද බැර සටහන් එම ගිණුමේ හර පැත්තේද වශයෙන් පැතිමාරුකර ගිණුමේ සටහන් කර තිබුණි.

**(B)** ඉදිරිපත් කර ඇති තොරතුරු උපයෝගී කරගෙන 2022 අප්‍රේල් මාසය සඳහා වෙළඳ ලැබිය යුතු මුදල් පාලන ගිණුම පිළියෙල කිරීමේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් වැරදි හා අඩුපාඩු සිදුකර තිබුණි.

(1) 2022 අප්‍රේල් 01 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් ආරම්භක ශේෂය ගිණුමට ගෙන නොතිබුණි.

(2) 2022 අප්‍රේල් 01 දිනට වෙළඳ ලැබිය යුතු මුදල් ආරම්භක ශේෂය ගිණුමේ බැරට සටහන් කර තිබුණි.

(3) හර වියයුතු සටහන් ගිණුමේ බැරටද බැර විය යුතු සටහන් ගිණුමේ හරටද සටහන් කර තිබුණි.

(4) අත්පිට විකුණුම් ගිණුමේ බැරට සටහන් කර තිබුණි.

(5) දෛනික විකුණුම්, ආපසු එවීම් පොතේ එකතුව හා මාසය තුලදී ලියාහල බොල්ණය ගිණුම පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(6) ගිණුම තුලනය කර අවසාන ශේෂය ගණනය කර නොතිබුණි.

# C - කොටස

**ප්‍රශ්න අංක 06 - ලකුණු 20**
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය (**a**) සහ (**b**) වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. **(a) කොටසින්** විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම සහ **(b) කොටසින්** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබුණි. සමස්ත කාර්ය සාධනය හොඳ මට්ටමක පැවතුණි.

පොදුවේ නිරීක්ෂණය වූ වැරදි / අඩුපාඩු පහත පරිදි වේ:

**(a) විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම:**

(1) වර්ෂයට අදාල නිවැරදි ක්ෂය ප්‍රමාණය ගණනය කර ආදායම් ප්‍රකාශනයට ගෙන නොතිබුණි.

(2) වර්ෂයට අදාල විදුලිය හා ජල බිල්පත් වියදම යන දෙකට අදාල උපචිත වියදම හා කලින් ගෙවූ වියදම සැලකිල්ලට ගෙන නොතිබුණි.

(3) විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කල යුතු අයිතමයන් පිළිබඳව අවබෝධයක් නොමැතිවීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් කල යුතු සමහර අයිතමයන් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කර තිබුණි.

(4) බොල්ණය වශයෙන් වර්ෂය තුල ලියා හරින ලද රු.75,000/- ක මුදල සටහන් කර නොතිබුණි.

(5) දළ ලාභය ගණනය කිරීම සඳහා සමහර අයදුම්කරුවන් විසින් වර්ෂයේ මුල් තොගය අඩුකර අවසාන තොගය එකතුකර තිබුණි.

(6) ශේෂ පිරික්සුමේ අයිතමයන් දහස් ගණනින් හා ගැලපිලිවල අයිතමයන් සම්පූර්ණ අගයන් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සඳහන්කර තිබුණි.

(7) 2022 ජනවාරි 01 දින ව්‍යාපාරයට මාරුකරන ලද පොත්වල වාර්තා කර නොමැති රු.1,000,000/- ක බෙදා හැරීමේ වෑන් රථය සඳහා අදාල මාස තුනක ක්ෂය වීම ගණනය කර විස්තීරණ ආදායම් ප්‍රකාශයට ඇතුලත් කර නොමැත.

(8) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ නියමිත ආකෘතිය ඉදිරිපත් කර නොතිබුණි.

(9) ව්‍යාපාරයේ නම සමග 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය යනුවෙන් සහන් කර නොතිබුණි.

(10) 2022 මාර්තු මාසයට අදාල බැංකු ණය පොලිය වූ රු.100,000/- ණය පොලී ගිණුමට එකතු කර ආදායම් ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි.

**(b) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කිරීම:**

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුලත් කළ යුතු අයිතමයන් පිළිබඳව මූලික අවබෝධයක් නොමැතිකම නිසා මිලදී ගැනුම්, විකුණුම්, ආරම්භක තොගය, කුලී ආදායම සහ වෙනත් වියදම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණි.

(2) උපචිත විදුලි, ජල බිල්පත් හා බැංකු ණය පොලියට අදාල අගයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ජංගම බැරකම් යටතේ ඇතුලත් කර නොතිබුණි.

(3) වෙළඳ ලැබිය යුතු මුදලින් වර්ෂය තුල ලියා හරින ලද රු.75,000/- ක බොල්ණය වෙළඳ ලැබිය යුතු මුදලින් නිවැරදිව අඩුකර නොතිබුණි.

(4) 2022 ජනවාරි 01 දින ව්‍යාපාරයට මාරුකරන ලද අමල්ට අයත්ව තිබූ රු.2,000,000/- ක් වටිනා ලොරි රථය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි.

(5) සමුච්චිත ක්ෂයවීම වෙනුවට වර්ෂයේ ක්ෂයවීම සටහන් කර තිබුණි.

(6) සමහර අයදුම්කරුවන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අයිතමයන් වර්ගීකරණය සිදු නොකර සියලුම අයිතමයන් එකට සටහන් කර තිබුණි.

උදාහරණ:- ජංගම නොවන වත්කම්, ජංගම වත්කම්, ස්කන්ධය හා වගකීම්, ජංගම වගකීම් යනුවෙන්

(7) වෙළඳ ලැබිය යුතු මුදල් ජංගම බැරකම් යටතේද වෙළඳ ගෙවිය යුතු මුදල් ජංගම වත්කම් යටතේද සටහන් කර තිබුණි.

- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේ සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. **විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් දියුණු කර ගැනීම.**

2. **අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙර වැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.**

3. **උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.**

4. **අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. උත්තර පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.**

5. **ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.**

6. **අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න ප්‍රත සහ යෝජිත උත්තර උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යුහයන් නැවතත් ප්‍රශ්න පත්‍ර තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.**

7. **මෙම විෂයට අදාළව ස්ව-අධ්‍යන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.**

8. **කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, උත්තර සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.**

9. **විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.**

- * * * -